# ඒකාබද්ධ ජල කළමනාකරණය

මිනිසා ජීවත් කරවීමේ මූලික හා ඉතා වැදගත් ස්වාභාවික සම්පත් වනුයේ පස සහ ජලයයි. ජනගහනය වැඩි සංවර්ධනය වන රටවල මෙම සම්පත් බලවත් පීඩනයකට ලක්ව ඇත. එහි ප්‍රතිඵලය වන්නේ පස ජලය සහ කැලෑ භයානක ලෙස විනාශවීමත්, තිරසාර කෘෂිකාර්මික ජීවන රටාවට බාධා ඇති වීමත්ය. මෙම සම්පත් භාවිතා කර ජීවත් වන දුප්පත් ගොවීන්ගේ අඩු දැනීම නිසා පරිසරය සමඟ නිරන්තර ගැටුම් ඇතිවීම ස්වභාවයකි. තිරසාර භාවයේ මූලික පදනමට ජලාධාර ප්‍රදේශය ප්‍රමුඛත්වයක් ගනී. මෙයින් තිරසාර පදනම මත බහුවිධ පිවිසුමෙන් වැඩි වාසි නොනවත්වා ලබාගත හැක. ඒකාබද්ධ ජලාධාර කළමනාකරණයේ අදහස වන්නේ ජලාධාර ප්‍රදේශයන්හි ඉඩම්, ජලය සහ ජීව විද්‍යාත්මක සම්පත් කළමනාකරණය පමණක් නොව සියලුම අනෙකුත් ක්‍රමවේදයන් භාවිතය මගින් එම ගොවීන්ගේ ජීවන රටාව සංවර්ධනය කිරීම තුළින් ජෛව විවිධත්වය අනාගත පරපුරට සුරක්ෂිත කර දීමයි.

## ඒකාබද්ධ ජලාධාර කළමනාකරණය

ඒකාබද්ධ ජලාධාර කළමනාකරණය ගැන විවිධ ජනයා විවිධ ලෙස තේරුම් ගෙන ඇත. නමුත් ඉඩම් භාවිත කරන්නන්ට අවශ්‍ය මූලික අරමුණ තිරසාර ඒකාබද්ධ ජලාධාර කළමනාකරණය මත ස්වාභාවික සම්පත් භාවිතය හා සංරක්ෂණයෙන් සඵල කරගත හැකි වේ. මහජනයා සමඟ මිත්‍ර වෙමින් පවතින පිළිවෙත් අනුගමනය කිරීමට ඔවුන් යොමු කිරීමට වඩා පැරණි ජලාධාර වැඩසටහන් වල අත්දැකීම් මුල් කරගෙන භෞතික ප්‍රගතින් කරා යොමු කරවීම නව පිවිසුම මගින් සිදුවේ.

ජලාධාරාවක් යනු විශේෂයෙන් ජලය, පස හා වෘක්ෂලතා ඇතුලු ස්වාභාවික සම්පත් සහ මිනිසා විසින් ගොඩ නඟන ලද විවිධ නිර්මාණයන්ද අඩංගු වන මුළු ප්‍රදේශය තුළ මතුපිටින් ගලායන ජලය එකම ජල ප්‍රභවයකට එකතුවන විෂමාකාර භූමි ප්‍රදේශයකි. මෙහි ඒකාබද්ධ කළමනාකරණය යනු ස්වාභාවික සම්පත් ප්‍රශස්ට ලෙස භාවිතා කිරීමෙන් හා කළමනාකරණයෙන් නිෂ්පාදනය වැඩි දියුණු කිරීම සහ ආරක්ෂා කිරීම වේ. ජලධාරයෙන් පරිබාහිරව ආයතනික ක්‍රියාකාරීත්වයෙන් ආර්ථික හා සමාජීය කටයුතු පිළිබඳව සලකා කටයුතු කරන බැවින්, මෙය වැදගත් වේ. එබැවින් ස්වාභාවික සම්පත් කාර්යක්ෂමව භාවිතා කිරීම හා ආරක්ෂා කිරීම ඒකාබද්ධ ජලාධාර කළමනාකරණයේ යොදා ගන්නා තීරණ ගැනීම හා විවිධ හැසිරීම් බහුවිධ පිවිසුම මගින් සිදුවේ. එනම් විවිධ වූ ප්‍රවේශයන් මගින් ජනතාව ඒකාබද්ධ කළමනාකරණ ක්‍රමවේදයන් උදෙසා යොමු කිරීමයි.

## සාර්ථක ජලාධාරයක්

සාර්ථක ජලාධාර කළමනාකරණය සඳහා ප්‍රජා සහභාගිත්වය ඒකාබද්ධතාවය බහුවිධ හැසිරීම සහ බහු අංශයන්ගේ පිවිසුම අවශ්‍ය වේ. එසේම ජලාධාර කළමනාරණයේදී අවධානය යොමු කරන්නේ ජලාධාරයක ජීවත්වන ජනතාවට ජලාධාරය කෙරෙහි පවත්නා ස්වකීය අයිතිය තහවුරු කිරීමත්, විශේෂයෙන් කාන්තාවන් සක්‍රියව කළමනාකරණය සඳහා දායක කරවීමත්, පවතින සම්පත් නිසි ලෙස පරිහරණය කිරීමට ඉඩ නොලැබෙන කණ්ඩායම් සිටී නම් ඔවුන්ට එම අවස්ථාව ලබාදීමත්, සියලු ප්‍රජාවට සම අයිතිවාසිකම් ලබාදීම තහවුරු කිරීමත්ය. මෙහිදී සියලු ප්‍රජාවගේ බලාපොරොත්තු ඉටුකර ගැනීමට ඉඩ ප්‍රස්ථාව මෙන්ම හැකියාවද තිබිය යුතුය.

## ඒකාබද්ධ ජලාධාර කළමනාකරණයේ ප්‍රධාන අරමුණු

ප්‍රජාවගේ හෝ ගොවීන්ගේ ඉපැයීම, නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සඳහා අවශ්‍ය පහසුකම් දියුණු කිරීම යන කරුණු තුළින් ඔවුන්ගේ තත්ත්වය නඟාලීම ඒකාබද්ධ ජලාධාර කළමනාකරණයේ බලාපොරොත්තුව වේ.

**ප්‍රධාන අරමුණු පහත දැක්වේ.**

- පස සංරක්ෂණයට හා ශාක ආවරණයට බලපාන අයුරු අතිරික්ත වැසි ජල උල්පත් උත්පාදනයට යොමු කිරීම තුළින් භූගත ජලය වර්ධනය කිරීම.

**ඩී.එම්.ඩබ්. දසනායක**
**හිටපු කෘෂිකර්ම නිලධාරී**

- භෝගයන්ගේ ඵලදායිතාවය ස්ථිරව පවත්වා ගෙන යාමට සුදුසු පසත් ප්‍රමාණවත් ජලය, පෝෂණ ද්‍රව්‍ය කලමනාකරණ පිළිවෙත් හා විවිධ වූ භෝග රටාවන් සහිත තිරසාර ගොවිතැන් ක්‍රමයකට ගොවීන් යොමු කිරීම.
- විවිධ වූ ඉඩම් පන්තිවල හැකියාවන් හා විභවය මත වගා ආවරණයන් වැඩි දියුණු කිරීම සඳහා උද්‍යාන භෝග හා තෘණ බිම් සංවර්ධනය කිරීම

- ගොවීන්ගේ ආදායම් තත්ත්වය වැඩි දියුණු වී කෘෂි ව්‍යාපාරිකයන්ගේ තත්ත්වයට ඔවුන් පත්වීම.
- කෘෂි දේශගුණය සමබර තත්ත්වයකට පත්වීම.

## ජලාධාර කළමනාකරණයේ මූලධම්

ගංවතුර පාලනය හා භූමි ඛාදනය අඩු කිරීම, ගොවීන්ගේ ජීවන තත්ත්වය දියුණු තත්ත්වයකට ගෙන ඒම සාර්ව ක ජලාධාර කළමනාකරණයේ අදහසය.

## ප්‍රධාන මූලධම්

- ඉඩම් වල පිහිටීම හා පසේ හැකියාවන් මත ඉඩම් භාවිතා කිරීම.
- විශේෂයෙන් වර්ෂා කාලය තුළ ප්‍රමාණවත් වෘක්ෂලතා ආවරණයක් පවත්වා ගෙන යෑම.
- වර්ෂාව පවතින විට හැකි තරම් වර්ෂා ජලය සංරක්ෂණය කිරීම.
- පාංශු ඛාදනය අවම කර ගනිමින්, පොළොව මතුපිටින් ගලන වැඩිපුර ජලය අනාගත ප්‍රයෝජනය සඳහා පොකුණු වල ගබඩා කිරීම.
- කාල අන්තරයක් තුළ පාංශු ඛාදනය පාලනය පිළිබඳ සුපරීක්ෂාකාරීවීම හා මළකඳුරු ඇතිවීම වැළැක්වීම සහ භූගත ජලය පෝෂණය කිරීම.
- ඒකීය ජල ප්‍රමාණයකින් ඒකීය කාළයක් තුළ ඒකීය බිම් ප්‍රමාණයකින් ලැබෙන නිෂ්පාදනය වැඩිකර ගැනීම.
- අනුගාමික වගාවන් සහ ඉඩමට සුදුසු අනුපාතයකට අන්තර් භෝග පිහිටුවීම සහ භෝග ඝණත්වය වැඩි කිරීම.
- ඉඩම් පරිහරණ රටා මගින් නිසරු ඉඩම් ප්‍රශස්තව උපයෝගී කර ගැනීම.
- මෙයින් ජලාධාරයක පවතින තිරසාර පද්ධතිය, එනම් මිනිසුන්, සිවුපාවුන්, පැළෑටි, ජලය ආදිය සංකීර්ණයට වාසිදායක වීම.
- වර්ෂයක් තුළ භෝග, සත්ත්ව පාලනය, දැව, කම්කරු වැනි ප්‍රභවයන්ගෙන් ලැබෙන ඒකාබද්ධ ආදායම් වැඩිවීම.
- නුසුදුසු දේශගුණය පවතින කාලවකවානු වලදී මුලු ආදයමේ අවදානම් තත්ත්වය අඩුවීම.
- ගබඩාකරණය ප්‍රවාහනය හා අලෙවියේ පවතින අඩුපාඩුකම් දියුණු වීම.

## සහභාගිත්වය පිළිවෙත තුළ පිහිටි මූලික අංගයන්

ඒකාබද්ධ ජලාධාර කළමනාකරණය සඳහා යොද ගන්නා සහභාගීත්ව ප්‍රවේශයේදී භාවිතාවන අංගයන් ඒකාබද්ධ ජලාධාර වැඩසටහන් වලදී වෙනස්වීම් වලට භාජනය වේ. එබැවින් ඒ පිළිබඳව නිතරම පසු විපරම් කිරීම අත්‍යාවශ්‍ය වේ.

## මූලික අංගයන්

- සහභාගිත්වය, බහුවිධ හැසිරීම් හා බහුවිධි පිවිසුම.
- ගොවින් සහ බලය ලත් නිලධාරින් එක්ව ඒකාබද්ධ ජලාධාර කළමනාකරණය පිළිබඳව විමසිලිමත්වීම.
- ජලාධාර කළමනාකරණ පිළිවෙත සහ එහි වැඩසටහන් පිළිබඳ බලය හා අයිතිය ගොවීන් සතුවීම.
- ජලාධාර කළමනාකරණ වැඩසටහන් මගින් ක්ෂණික වාසි උත්පාදනය වන බවට සහතික වීම.
- ප්‍රධාන උත්පාදකයන් වන කාන්තා පක්ෂය හා අවාසිදායක කණ්ඩායම බලගැන්වීම හා ඔවුනට ප්‍රතිලාභ සැලැස්වීම.

## ඒකාබද්ධ ජලාධාර කළමනාකරණයේ වාසි

- ඉඩම් ඛාදනය අඩු කිරීම, ගංවතුර පාලනය සහ භෝග ජල අවශ්‍යතාවය දියුණු වීම.
- ඒකීය ජල ප්‍රමාණයකින් ඒකීය කාලයක් තුළ ඒකීය බිම් ප්‍රමාණයක ලබාගත හැකි අස්වැන්න දියුණු වීම.
- සුදුසු ඉඩම් පරිහරණ රටාවක් තුළින් අඩු නිෂ්පාදනයන් සහිත නිසරු ඉඩම් අඩුවීම.
- ක්‍රමානුකූලව හා දීර්ඝ කාලීනව ප්‍රතිලාභ ලැබෙන අයුරින් භාවිතයට ගැනීමට හැකිවීම.
- නුසුදුසු දේශගුණික තත්ත්වයක වුවද එම ඉඩම්වල ආදායම් තත්ත්වය ස්ථිර වීම.
- ගබඩාකරණය, ප්‍රවාහනය හා අලෙවියෙහි පවතින අඩුපාඩුකම් වැඩි දියුණුවීම.
- භෝග වගාව, සත්ත්ව පාලනය, දැව වගා හා කම්කරු යන සංකීර්ණතාවයන්ගේ අන්තර් සම්බන්ධතාවයන් නිසා වර්ෂයක් පුරා ඒකාබද්ධ ආදායම් වැඩිවීමෙන් ගොවීන්ගේ ජීවන තත්ත්වය වැඩි දියුණුවීම.

- දේශගුණය සමබරවීම.

මෙහි ඒකාබද්ධ ජලාධාර කළමනාකරණයේ සංකල්පයන් සහ "වර්ෂා ජලයෙන් වගා කටයුතු කිරීම හා තිරසාරව ස්වාභාවික සම්පත් භාවිතය" යන පුහුණු වැඩමුළුවකදී ඉදිරිපත් වූ ලිපියක් හා මාගේ ප්‍රායෝගික දැනීම ඇසුරෙන් සකස් කරන ලදී.

මෙහි විස්තර කරන ලද මූලධර්මයන් හා මූලිකාංග යන් අපගේ ක්ෂේත්‍ර, සමාජ රටාව, ආයතනික තත්ත්වයන් ආදී වූ විවිධ සංකලනයන් සමඟ භාවිතයේදී උද්ගත විය හැකි ප්‍රශ්න හා ගැටළු අනුව සුදුසු පරිදි වෙනස්කම් වලට ලක් කරමින් සාර්ථකත්වයන් කරා යාමට අවශ්‍ය ආකාරයට හසුරුවා ගත යුතුයි. එහෙත් මූලික අරමුණ වන ස්වාභාවික සම්පත් ආරක්ෂා කරමින් තිරසාර සංවර්ධනය කරා යෑම යන්න පෙරදැරි විය යුතුයි.

# ගව සම්පත...

හෙළ රජ දවස රට කිරි පැණි වීනු
ගව සම්පතට දැන්වත් නිදහස ගේනු
දැක අප මස් බුදින තිරිසනුගේ මුණු
කකියයි පපුව උණුවී රතු රුධිරාණු

මව ගව දෙනක මුත් කිරි දෙන මවකි ලොවේ
මගෙ ලේ නහර අතරත් දරු සෙනෙහෙ දිවේ
මිනිසා මගේ මස් කද්දී නිතර දිවේ
අම්මා මරා ගෙන කන එක පුදුම නොවේ

ලාඩන් පතුරු ටික කකුලට ගෙවන තුරු
මම ගවයකිම් බර ඇද්දේ හොඳට හුරු
අඩපන වෙද්දී මහලුව ගිය ගති නිදිරු
දෙයි මා මරාගෙන කන්නට අයිති කරු

**ගොම පොහොරිනි කළේ මේ බිම සරු සාර**
**කුමටද කෝටි ගණනක් යන රට පෝර**
**දැක ඇති සම්බුදු සඳ ලෝකෙට යන පාර**
**මිනිසා ගෙවන්නේ යුගයකි අවිචාර**

**ඒ. එන්. සාන්ත**
**ව්‍යාප්ති හා පුහුණු අංශය**
**කෘෂිකර්ම දෙපාර්තමේන්තුව**